## පාර්ලිමේන්තු යෝජනා සම්මතය

## 2019 අප්‍රේල් 21 වන දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාර පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව

2019 අප්‍රේල් 21 වැනි දින ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල සිදු වූ ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් 250කට වැඩි පුද්ගලයන් ජීවිතක්ෂයට පත්වී, පුද්ගලයන්ට හානි සිදු වී, දේපළ විනාශ වූ හෙයින් ද;

(අ) එවැනි ප්‍රහාරවලට පෙර ඒ සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත ලැබී තිබුණේද යන්නත්;

(ආ) එවැනි ප්‍රහාර වැළැක්වීමට සහ / හෝ ඒවා අවම කිරීමට අදාළ බලධාරීන් ප්‍රමාණවත් පියවර ගත්තේද යන්නත්;

(ඇ) එවැනි ප්‍රහාරයන්ගේ බලපෑම වැළැක්වීමට සහ / හෝ අවම කිරීමට නොහැකි වීමට හේතුවූ රාජ්‍ය යාන්ත්‍රණයේ අඩුපාඩු තිබුණේද යන්නත්;

(ඈ) එවැනි ත්‍රස්තවාදී ප්‍රහාරවලට දායක වූ වෙනත් කරුණු තිබේද යන්නත්;

*(ඉ) ත්‍රස්තවාදීන්ට අනුබල දුන් ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට හෝ ආණ්ඩුකාරවරයෙකුට හෝ ඕනෑම පුද්ගලයෙකුට විරුද්ධව ඇති චෝදනා සත්‍ය ද යන්නත්,

(ඊ) අනාගතයේදී එවැනි ප්‍රහාරයන් සිදුවීම වැළැක්වීමට ගත යුතු ක්‍රියාමාර්ග කවරේද යන්නත්; සහ පෙරකී දැට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් කරුණු;

පිළිබඳව සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාව සහ එහි සභාපතිවරයා නම් කරනු ලැබිය යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101හි විධිවිධානයන්ට අනුව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරු දොළොස් (12) දෙනෙකුට වැඩි ගණනකින් සංයුක්ත නොවිය යුතු ය.

3. එම කාරක සභාවට, —

(අ) සිය ගණපූරණය නියම කරගැනීමටද;

(ආ) පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තන් කැඳවීමට ද, යම් ලේඛන හෝ වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද; එවන් පුද්ගලයෙකුගේ පාලනය යටතේ තිබෙන යම්කිසි පත්‍රිකාවක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද;

(ඇ) කාරක සභාවේ සභාපතිවරයා හෝ ඒ වෙනුවෙන් විශේෂයෙන් බලයලත් පුද්ගලයෙක් විසින් සිදුකරන දිවුරුම්දීමක් හෝ ප්‍රතිඥාදීමක් මත සාක්ෂිකරුවන් පරීක්ෂා කිරීම සහ සාක්ෂිකරුවන්ගෙන් වාචික පරීක්ෂණ මගින් ස්ථිරකර ගැනීමට හෝ නිශ්චය කර ගැනීමටද;

(ඈ) පාර්ලිමේන්තුවෙන් පිටත රටේ ඕනෑම තැනක රැස්වීම් පැවැත්වීමටද;

(ඉ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට; සහ

(ඊ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත්කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතු ය.

4. කාරක සභාව තම පළමු රැස්වීම් දිනයේ සිට මාස තුනක් (03) ඇතුළත හෝ පාර්ලිමේන්තුව විසින් නියම කරන වෙනත් හෝ වැඩිමනත් කාල සීමාවක් තුළ තම වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.

*2019.05.23 දින ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා, පා.ම. විසින් ඉදිරිපත් කරන ලදුව පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සංශෝධනය.